# පටුන


| | | |
|---|---|---|
| **1.0** | දැක්ම ………………………………………………………….. | **1** |
| **2.0** | මෙහෙවර…………………………………………………………. | **1** |
| **3.0** | 2014 අංක 33 දරන ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනත…… | **1** |
| **4.0** | මූලික පරමාර්ථ ………………………………………………. | **1** |
| **5.0** | සංවිධානය ………………………………………………………... | **2** |
| **6.0** | ක්‍රියාකාරී ක්ෂේත්‍රයන් ………………………………………… | **5** |
| | **6.1** කර්මාන්ත සේවා අංශය ……………………………. | **7** |
| | **6.2** සංවර්ධන අංශය ……………………………………… | **10** |
| | **6.3** විද්‍යුත් යාන්ත්‍රික සේවා අංශය ………………………. | **18** |
| | **6.4** කර්මාන්ත පුහුණු අංශය …………………………….. | **28** |
| | **6.5** මානව සම්පත් සහ පරිපාලන අංශය ………………… | **37** |
| | **6.6** මූල්‍ය අංශය …………………………………………..... | **40** |

# ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය (CIDA)

## 1.0 දැක්ම

''ගෝලීය ප්‍රමිතීන් හා සමාන්තරව දිවෙන විශ්වාසනීය හා යෝග්‍ය වූ ඉදිකිරීම් කර්මාන්තයන් ශ්‍රී ලංකාවේ බිහිකිරීම.''

## 2.0 මෙහෙවර

''ජාතික ඉදිකිරීම් ප්‍රතිපත්තිය හරහා රෙගුලාසි පැනවීම, ශක්‍යතාව වර්ධනය සහ නැංවීම මඟින් තිරසාර ජාතික සංවර්ධනයට ඉවහල් වන්නා වූ ගෝලීය සහ දේශීය අවශ්‍යතාවයන් සපුරාලිය හැකි උසස් ප්‍රමිතීන් ප්‍රවර්ධනය තුළින් ශක්තිමත් මෙන්ම වෘත්තීය තත්ත්වයෙන් යුතු කර්මාන්තයන් සහතික වීම තුළින් ශ්‍රී ලංකාවේ ඉදිකිරීම් කර්මාන්තය සඳහා උපායශීලි නායකත්වයන් ලබාදීම.''

## 3.0 2014 අංක 33 දරන ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනත

2014 අංක 33 දරන ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනතෙහි දීර්ඝ වූ නිල නාමය මඟින් ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියෙහි සමස්ථ අරමුණු සහ ඉලක්කයන් පහත පරිදි පිළිඹිබු කරයි.

''ශ්‍රී ලංකාවේ ඉදිකිරීම් කර්මාන්තයේ සංවර්ධනය සඳහා විධිවිධාන සැලැස්වීම පිණිසද, ඉදිකිරීම් කර්මාන්තයේ කටයුතු නියාමනය කිරීම, ලියාපදිංචි කිරීම, විධිමත් කිරීම සහ ප්‍රමිතිකරණය කිරීම සඳහා ද, ඉදිකිරීම් සම්බන්ධ ජාතික උපදේශන සභාව පිහිටුවීම සඳහාද, ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය පිහිටුවීම සඳහා ද, ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අරමුදල සහ ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ අරමුදල පිහිටුවීම සඳහාද, කර්මාන්තයට අදාළ වෘත්තිකයන්, නිෂ්පාදකයන්, සැපයුම්කරුවන්, කොන්ත්‍රාත්කරුවන් සහ ශිල්පීන්ගේ දියුණුව සහ සුභසාධනය සඳහා විධිවිධාන සැලසීම පිණිසද, ඉදිකිරීම් කටයුතු වලට අදාළ ආරවුල් නිරවුල් කිරීම සඳහා ද, ශ්‍රී ලංකාවේ ඉදිකිරීම් කර්මාන්තය තුළ මහජන ආරක්ෂාව තහවුරු කිරීම සහ ඒ හා සම්බන්ධිත හෝ ඊට ආනුෂාංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.''

## 4.0 මූලික අරමුණු

**ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියෙහි ප්‍රධාන අරමුණු වන්නේ:**

I. ගරු අමාත්‍යතුමාගේ මග පෙන්වීම හා සමගාමීව ඉදිකිරීම් කර්මාන්තය පිළිබඳව ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට සහතික වීම.

II. ඉදිකිරීම් අංශය තුළ තිරසාර වර්ධනය, ප්‍රතිසංස්කරණය සහ වැඩිදියුණුව තීව්‍ර කිරීම අරමුණු කොට මෙම කර්මාන්තයේ නිරතව සිටින පාර්ශවකරුවන්ට අවශ්‍ය නායකත්වය ලබාදීම.

III. වරින් වර නියම කරනු ලබන ආකාරයට ඉදිකිරීම් කර්මාන්තයේ නියුතු පාර්ශවකරුවන් ලියාපදිංචි කිරීම සහ ලියාපදිංචිය අලුත් කිරීම.

IV. බලශක්තිය කාර්යක්ෂමව පරිභෝජනය කළ හැකි වන ආකාරයට ගොඩනැගිලි සහ ආකෘති සැලසුම් කිරීම සඳහා විශේෂ අවධානයන් යොමු කිරීමෙන් ඉදිකිරීම් කර්මාන්තයේ තිරසාර සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම.

V. ඉදිකිරීම් කර්මාන්තයට සහ එහි වර්ධනයට අදාළ වන්නා වූ ඕනෑම කරුණක් පිළිබඳව පර්යේෂණ කටයුතු ප්‍රකාශනයට පත්කිරීම සහ ඒවා ව්‍යාප්ත කිරීම සහ නිසි පර්යේෂණයන් ප්‍රවර්ධනය කිරීම.

VI. අනෙකුත් අදාළ බලධාරින්ගේ උපදෙස් සමඟ ඉදිකිරීම් කර්මාන්තයේ ප්‍රමිතීන් විධිමත්ව සකස් කිරීම සහ ඒවා අනිවාර්ය සහ ඉච්ඡානුගත ප්‍රමිතීන් වශයෙන් වර්ගීකරණය කිරීම.

VII. බලධාරියා විසින් විධිමත්ව සකසා ඇති පරිදි පරිචයන්, ක්‍රියාපරිපාටින් සහ ක්‍රියාදාමයන් ක්‍රියාවට නැංවීම.

## 5.0. සංවිධානය

### හැඳින්වීම

2014 අංක 33 දරන ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනතෙහි විධිවිධාන යටතේ ඉදිකිරීම් අභ්‍යාස සහ සංවර්ධන ආයතනයට (ඉක්ටාඩ්) අනුප්‍රාප්තිකයා වශයෙන් ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය (සිඩා) ස්ථාපිත කර ඇත. එහි මූලිකත්වය කළමනාකරණ මණ්ඩලයේ සභාපති විසින් දරනු ලබයි.

### කළමනාකරණ මණ්ඩලය

| | නම සහ පෞද්ගලික ලිපිනය | තනතුර | පත්වීම් දිනය |
|---|---|---|---|
| 1 | ආචාර්ය එච්. ඊ. ජෝකිම්<br>27/6, පීටර්සන් පටුමග,<br>වැල්ලවත්ත,<br>කොළඹ 05. | සභාපති | 2016.09.12 |
| 2 | ජී. වන්නිනායක මහතා<br>නීතීඥ,<br>17/3,පිරිවෙන පාර,<br>බොරලැස්ගමුව | සාමාජික | 2015.03.14 |
| 3 | පී.බී.එස්.සී. නෝනිස් මහතා<br>අධ්‍යක්‍ෂ, රාජ්‍ය මූල්‍ය දෙපාර්තමේන්තුව<br>මහා භාණ්ඩාගාරය,<br>කොළඹ 01. | සාමාජික | 2015.02.27 |
| 4 | මහාචාර්ය චිත්‍රා වෙඩික්කාර<br>No. 31 A, ඇල්බට් පෙදෙස,<br>දෙහිවල. | සාමාජික | 2015.02.09 |
| 5 | හේමන්ත අපොන්සු, වරලත් ප්‍රධාන සමීක්‍ෂණ<br>නො. 45/B, පාසල් මාවත,<br>නාවල | සාමාජික | 2015.02.09 |
| 6 | ඉංජිනේරු එල්.ඩබ්.පාලිත<br>අධ්‍යක්‍ෂ (නාගරික පදිංචි කිරීම්)<br>නිවාස සහ ඉදිකිරීම් අමාත්‍යාංශය<br>'සෙත්සිරිපාය'<br>බත්තරමුල්ල. | සාමාජික | 2015.02.16 |
| 7 | කලීල් කාසිම් මහතා<br>නො. 16, අනුලා පාර,<br>කොළඹ 06. | සාමාජික | 2015.02.16 |

| | | | |
|---|---|---|---|
| 8 | මේජර් රංජිත් ගුණතිලක<br>කළමණාකාර අධ්‍යක්ෂ,<br>සන්කෙන් ලංකා (පුද්ගලික) සමාගම,<br>295, මාදම්පිටිය පාර,<br>කොළඹ 14. | සාමාජික | 2015.02.16 |
| 9 | මහාචාර්ය ඒ.කේ.ඩබ්. ජයවර්ධන<br>උප කුලපති<br>මොරටුව විශ්වවිද්‍යාලය,<br>කටුබැද්ද,<br>මොරටුව. | සාමාජික | 2015.03.09 |
| 10 | ඉංජිනේරු ජේ.කේ. ලංකාතිලක<br>ශ්‍රී ලංකා සංස්ථාපිත ඉංජිනේරු ආයතනය<br>27/B, උඩුමුල්ල,<br>බත්තරමුල්ල.<br><br>14, ශේඩ් ග්‍රෝව් මාවත,<br>කොළඹ 08. | සාමාජික | 2015.11.20 |
| 11 | රුක්ෂාන් ජයවර්ධන මහතා<br>No. 55, මල්පාර,<br>කොළඹ 07. | සාමාජික | 2015.02.16 |
| 12 | ඒ.පී. ගලගොඩ මහතා<br>ශ්‍රී ලංකා ජාතික ඉදිකිරීම් සංගමය<br>''ඉදිකිරීම් මැදුර'' 350 ඒ<br>පන්නිපිටිය පාර, පැලවත්ත,<br>බත්තරමුල්ල | සාමාජික | 2015.11.20 |
| 13 | ඉංජිනේරු එච්.පී.ආර්. ගුණවර්ධන<br>ශ්‍රී ලංකා ඉංජිනේරු උපදේශකයින්ගේ සංගමය,<br>415, බෞද්ධාලෝක මාවත,<br>කොළඹ 07. | සාමාජික | 2015.11.20 |
| 14 | ඉංජිනේරු කේ.පී.අයි.යූ. ධර්මපාල<br>ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය,<br>120/15,<br>විජේරාම මාවත,<br>කොළඹ 07. | සාමාජික | 2015.11.20 |

ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය (සිඩා) හි කාර්යයන් පහත දක්වා ඇති පරිදි අංශ 4 ක් මඟින් පවත්වාගෙන යනු ලබන අතර සෑම අංශයක්ම අධ්‍යක්ෂවරයකුගේ ප්‍රධානත්වයෙන් පාලනය කරයි.

අ. කර්මාන්ත සේවා අංශය

ආ. සංවර්ධන අංශය

ඇ. විද්‍යුත් යාන්ත්‍රික සේවා අංශය

ඈ. කර්මාන්ත පුහුණු කිරීමේ අංශය

පනතෙහි දක්වා ඇති කාර්යයන් නියමිත කාල රාමුව තුල ක්‍රියාත්මක කිරීම සහතික වෙමින් එම සියළුම කාර්යයන් ආවරණය වන පරිදි ඒකාබද්ධ සැලැසුම සකස් කර ඇත. 2016 වසරේ සිට 2021 දක්වා කාලය සඳහා පිළියෙල කර ඇති ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන ප්‍රතිපත්තිය, ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනත සහ ඒකාබද්ධ සැලසුම ආදිය අනුසාරයෙන් 2016 වසර සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලසුම පිළියෙල කර ඇත.

ආයතනයේ කාර්ය මණ්ඩලයේ පරිපාලනමය වගකීම සභාපතිතුමන්ගේ මඟ පෙන්වීම යටතේ ප්‍රධාන විධායක නිලධාරී අධ්‍යක්ෂ ජනරාල් විසින් දරනු ලබයි. මෙහෙයුම් අංශ වන මානව සම්පත් සහ පරිපාලන අංශය සහ මුදල් අංශය පිළිවෙලින් පරිපාලන කටයුතු සහ මුදල් කටයුතු පිළිබඳ අධ්‍යක්ෂවරයෙකු යටතේ පාලනය වේ. (කරුණාකර ක්‍රියාකාරී ක්ෂේත්‍රයන් පිළිබඳ වගුව බලන්න.)

ඉලක්ක ගත කාලය සමඟ 2016 වසරේදී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කළ කාර්යයන් සහ එක් එක් කාර්යයන්ගෙන් අපේක්ෂිත ආදායම සහ ලබා ඇති ප්‍රතිඵල එම අදාළ අංශයන් යටතේ සවිස්තරව දක්වා ඇත.

## 6.0. ක්‍රියාකාරී ක්ෂේත්‍රයන්

**සංවිධාන ව්‍යුහය**
**ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය (සිඩා)**



## සිඩා (CIDA) සේවක සංඛ්‍යාව - 31.12.2016

| වැටුප් කේතය | සේවා කාණ්ඩය | අනුමත සේවක සංඛ්‍යාව | සත්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| | **ජ්‍යෙෂ්ඨ මට්ටම** | | | |
| HM 2-1 | අධ්‍යක්ෂ ජනරාල් | 1 | 1 | 0 |
| HM 1-3 | අධ්‍යක්ෂ | 6 | 3 | 3 |
| MM 1-1 | සහකාර අධ්‍යක්ෂ/ නියෝජ්‍ය අධ්‍යක්ෂ | 28 | 15 | 13 |
| | **එකතුව** | **35** | **19** | **16** |
| | **තෘතීයික මට්ටම** | | | |
| JM 1-2 | කණිෂ්ඨ කළමනාකරු | 40 | 23 | 17 |
| | **එකතුව** | **40** | **23** | **17** |
| | **ද්විතීක මට්ටම** | | | |
| M A 1-2 | කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) | 80 | 71 | 9 |
| M A 2-2 | කළමනාකරණ සහකාර (තාක්ෂණික) | 24 | 16 | 8 |
| | **එකතුව** | **104** | **87** | **17** |
| | **ප්‍රාථමික මට්ටම** | | | |
| PL-3 | ප්‍රාථමික මට්ටම (ශිල්පීය) | 86 | 60 | 26 |
| PL-2 | ප්‍රාථමික මට්ටම (අර්ධ ශිල්පීය) | 9 | 4 | 5 |
| PL-1 | ප්‍රාථමික මට්ටම (ශිල්පීය නොවන) | 44 | 34 | 10 |
| | **එකතුව** | **139** | **98** | **41** |
| | **ආරක්ෂක අංශය** | | | |
| M A 1-2 | ආරක්ෂක නිලධාරි/ සුපරීක්ෂක | 9 | 6 | 3 |
| PL-1 | ආරක්ෂක නියාමක | 33 | 16 | 17 |
| | **එකතුව** | **42** | **22** | **20** |
| | | **360** | **249** | **111** |

## 6.1 කර්මාන්ත සේවා අංශය

කොන්ත්‍රාත් කළමනාකරණය සහ පාලනය, උපදේශන සහ ව්‍යාපෘති කළමනාකරණ සේවා, සුදුසුකම් සහිත පුද්ගලයින් ලියාපදිංචිය, කාර්මික විගණනය ,ගිවිසුම් ආරවුල් නිරාකරණය සහ ඉදිකිරීම් කර්මාන්තයේ සංවර්ධනය සඳහා අවශ්‍ය වන්නා වූ වෙනත් ප්‍රතිපාදනයන්ගේ අවශ්‍යතාවය හැඳිනගැනිමත් සමඟම කර්මාන්ත සේවා අංශය විධිමත්ව සකස් කරන ලදි.

2016 වසර තුළදී උපදේශකයින්, කොන්ත්‍රාත්කරුවන්, ප්‍රතිපත්ති සම්පාදකයින්, ආයෝජකයින් වැනි පාර්ශවකරුවන් සඳහා පහත සඳහන් ක්ෂේත්‍රයන් වෙත කර්මාන්ත සේවා අංශය මගින් තම සේවය සලසා ඇත.

i. උපදෙස් සැපයීම, උපදේශන සේවා ආරවුල් නිරාකරණය, ගිවිසුම් ප්‍රකාර ගැටළු සඳහා තීරකයින් පත්කිරීම.
ii. ව්‍යාපෘති කළමනාකරණ සේවා සැපයීම.
iii. ඉදිකිරීම් සංඛ්‍යාලේඛන විවරණතාව ප්‍රකාශනය සහ අලෙවිය.
iv. සිඩා (CIDA ) මාර්ගෝපදේශ සහ පිරිවිතර.
v. සම්මත ලංසු ලිපිලේඛන ප්‍රකාශනය සහ අලෙවිය.
vi. ඉදිකිරීම් කර්මාන්තයට අදාල මාතෘකා සම්බන්ධව සම්මන්ත්‍රණ පැවැත්වීම.
vii. සුදුසුකම් සහිත පුද්ගලයින්ගේ නාම ලේඛනයක් සහ හඳුනාගත් ඉදිකිරීම් වැඩ සඳහා ලේඛනයක් පවත්වාගෙන යාම (නිමාකර නොමැත.)
viii. සුදුසුකම් සහිත පුද්ගලයින් ලියාපදිංචිය.
ix. ''හඳුනාගත් ඉදිකිරීම් වැඩ '' ලියාපදිංචිය.
x. බේරුම්කරණයන් සඳහා ක්‍රමවේදයන් ස්ථාපිත කිරීම ( සිදු කෙරෙමින් පවතී)
xi. පරිසරය සහ මහජන සෞඛ්‍ය පිළිබඳව නීති සහ රෙගුලාසි ස්ථාපිත කිරීම (සිදු කෙරෙමින් පවතී)
xii. සදාචාර ප්‍රතිපත්ති සහ සමාජ ප්‍රමිතීන් සඳහා නීති රෙගුලාසි ස්ථාපිත කිරීම (සිදු කෙරෙමින් පවතී)

### 6.1.1 ගිවිසුම්ගත කරුණු සම්බන්ධයෙන් හා උපදේශන සේවා සැපයීම, ආරවුල් නිරාකරණය, තීරකයින් පත්කිරීම.

මෙම අංශය මඟින් ටෙන්ඩර් ලේඛන පිළියෙල කිරීම, ගිවිසුම් පාලනය, ආරවුල් නිරාකරණය, සිඩා (CIDA) සූත්‍ර ක්‍රමය සහ සිඩා (CIDA) සම්මත ටෙන්ඩර් ලේඛන පිරිවිතර ආදිය සඳහා උපදෙස් සේවා සැපයීම සිදුකරයි. විශාල සංඛ්‍යාවක් වූ කොන්ත්‍රාත්කරුවන් මුහුණ දී ඇති කොන්ත්‍රාත් ලේඛණයන්ට අදාළ ගිවිසුම්ගත ආරවුල්, ගෙවීම් සහ ගිවිසුම් පරිපාලනය සම්බන්ධයෙන් මෙම අංශයේ උපදෙස් ලබාගෙන ඇත. මෙම අංශය විසින් 2016 වසර තුළ ඉහත සඳහන් කර ඇති ගැටළු වලට අදාළව උපදෙස් සේවා 420 ක් පමණ සංඛ්‍යාවක් ලබා දී ඇත. ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය, විදුලිබල මණ්ඩලය, ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය වැනි ආයතන සඳහා විශේෂ උපදෙස් සේවා මෙමඟින් සපයනු ලබයි.

ගිවිසුම් වලට අදාළ පාර්ශවයන්ගේ ඉල්ලීම මත 2016 වසර තුළ තීරකයින් 19 දෙනෙකු පත්කරන ලදි. තීරකයින්ගේ ලැයිස්තුව සිඩා (CIDA) වෙබ් අඩවියෙහි පළකර ඇත.

2016 වසර තුළ පහත සඳහන් බේරුම්කරණ සේවාවන් සපයන ලදි.

- ගොඩනැගිලි දෙපාර්තමේන්තුවට එරෙහිව ලාෆ් ඉංජිනේරු සේවය.
- ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලයට එරෙහිව සුමනසේකර ඉදිකිරීම් පුද්ගලික සමාගම
- නියෝජ්‍ය මහ ලේකම් (ඉංජිනේරු) - බස්නාහිර පළාත් සභාව එරෙහිව කැලික්ස් ගොඩනැගිලිකරුවන්

2016 වසර තුළ සිඩා (CIDA) වෙබ් අඩවියේ බේරුම්කරුවන්ගේ නාමලේඛණයක් ප්‍රකාශයට පත්කර ඇත.

**6.1.2 ව්‍යාපෘති කළමනාකරණ සේවා සැපයීම**

රාජ්‍ය සංවිධාන තම ගොඩනැගිලි ව්‍යාපෘති ක්‍රියාවට නැංවීම සඳහා ව්‍යාපෘති කළමනාකරණ සේවාවන් මෙම අංශය මගින් ලබා ගනියි. ප්‍රසම්පාදන ක්‍රියාවලිය සඳහා උපදෙස් සැපයීම, ටෙන්ඩර් ලේඛණ පිළියෙල කිරීම, කොන්ත්‍රාත්කරුවන් සහ උපදේශකයින් තෝරා ගැනීම, ටෙන්ඩර් ඇගයීම, කොන්ත්‍රාත් පරිපාලනය සහ අන්තර් ගෙවීම් සහතික පිළියෙල කිරීම යන අංශයන් මෙම සේවාවන්ට අයත් වේ.

2016 වසර තුළ ව්‍යාපෘති කළමනාකරණ සේවාවන් සපයා ඇති ප්‍රධාන සංවිධාන පහතින් දැක්වේ.

i. ප්‍රතිපත්ති සැළසුම් දෙපාර්තමේන්තුව භාවිතා කරන භූමිය.
ii. ආයුර්වේද රෝහල, කයිතඩි.
iii. රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව.
iv. ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය.
v. රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව.
vi. පොල් සංවර්ධන අධිකාරිය
vii. ශ්‍රී ලංකාවේ හස්ත කර්මාන්ත මණ්ඩලය - ලක්සල - බම්බලපිටිය
viii. තේමා උද්‍යානය, මොලඩි හවුස්
ix. හේවගේ ඉදිකිරීම් සමාගම

**6.1.3. ඉදිකිරීම් සංඛ්‍යාලේඛන ඇතුළත් ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය (CIDA) මාසික විවරණතාව ප්‍රකාශයට පත්කිරීම.**

සිඩා (CIDA) ඉදිකිරීම් සංඛ්‍යාලේඛන විවරණය මාසිකව ප්‍රකාශයට පත් කරයි. මේ සඳහා ඉදිකිරීම් අමුද්‍රව්‍ය මිල ගණන්, කම්කරු වේතන සහ යන්ත්‍රෝපකරණ කුලියට දීමේ මිල ගණන් ආදිය පිළිබඳව තොරතුරු රැස් කිරීම, පරීක්ෂා කිරීම සහ විශ්ලේෂණය කිරීම සිදුකරනු ලබයි. මෙම විවරණතාවන් ප්‍රධාන වශයෙන් භාවිතා කරන්නේ ඉදිකිරීම් ව්‍යාපෘති සඳහා භාවිතා කරන යෙදවුම් වල මිල ගණන් උච්චාවචනයන් ගණනය කිරීම සඳහාය. මෙම විවරණතාවන්ගේ පිටපත් 1565 ක් පමණ ඉදිකිරීම් කර්මාන්තයේ නියැළී සිටින පාර්ශවකරුවන්ට මෙම වසර තුළ දී අලෙවි කර ඇත.

**6.1.4. සිඩා (CIDA) මාර්ගෝපදේශ සහ ප්‍රමිතීන් ප්‍රකාශයට පත්කිරීම සහ අලෙවිය.**

2016 වසරේදී සංශෝධනය කරන ලද ලේඛන,

i. වාර ගැන්වූ විදිපිරි කොන්ක්‍රීට් කණු සඳහා පිරිවිතර -ICTAD/DEV/16
ii. ගොඩනැගිලි සහ සිවිල් ඉංජිනේරු වැඩ සඳහා ස්ථානීය පරීක්ෂාවන් සඳහා පිරිවිතර - ICTAD/DEV/17 –
iii. සම්මත සිවිල් ඉංජිනේරු මිණුම්කරණ ක්‍රමවේදයන් – CESMMSL
iv. වාරිමාර්ග සහ ජලප්‍රවාහන වැඩ සඳහා පිරිවිතර -SCA/3/1

**2016 වසරේදී ප්‍රකාශයට පත් කරන ලද ලේඛන;**

- ICTAD/DEV/16 –වරගැන් වූ විදිපිරි කොන්ක්‍රීට් කණු සඳහා පිරිවිතර

**6.1.5. සම්මත ලංසු ලේඛන ප්‍රකාශණය සහ අලෙවිය**

පහත සඳහන් සම්මත ලංසු ලේඛන සංශෝධනයට ලක්කරන ලදි.

- SBD මහා පරිමාණ කොන්ත්‍රාත්
- SBD කුඩා සහ මධ්‍ය පරිමාණ කොන්ත්‍රාත්
- SBD සැලසුම් සහ ගොඩනැගිලි කොන්ත්‍රාත්

**6.1.6. ඉදිකිරීම් කර්මාන්තයට අදාල මාතෘකා පිළිබඳව සම්මන්ත්‍රණ පැවැත්වීම**

**i.** ඉදිකිරීම් සඳහා අයකිරීම් සහ ආරවුල් නිරාකරණය.

**ii.** ව්‍යාපෘති කළමනාකරණය සහ කොන්ත්‍රාත් පරිපාලනය.

**iii.** ඉදිකිරීම් කර්මාන්තය නියාමනය කිරීම සහ අනුමැතිය ලබාදීම.

**iv.** මිල උච්චාවචන සූත්‍රය සහ ගිවිසුම් සඳහා අයකිරීම්.

**6.1.7. කාර්මික විගණනය**

අධිකාරිය විසින් තත්ත්ව කළමනාකරණ විගණනයන් පිළිබඳ ලේඛනයක් ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනතෙහි විධිවිධාන වලට අනුකූලව කාර්මික විගණනයක් සිදුකිරීම සඳහා පවත්වා ගෙන යනු ලබයි. කාර්මික විගණන කමිටුව මඟින් කාර්මික විගණන පිළිබඳ නීති හා රෙගුලාසි කෙටුම්පත් කර කළමනාකරණ මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලදි.

**6.1.8. සුදුසුකම්ලත් පුද්ගලයින් ලියාපදිංචි කිරීම**

ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනතෙහි විධිවිධානයන්ට අනුකූලව සුදුසුකම්ලත් පුද්ගලයින්ගේ නාමලේඛනයක් අධිකාරිය විසින් පවත්වාගෙන යනු ලබයි. අදාළ වෘත්තීය ඒකකයක් නියෝජනය කරනු ලබන සහතිකලත් කමිටුව සුදුසුකම්ලත් පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ නිර්ණායනයන් වර්ධනය කිරීමේ කාර්යය සඳහා පත්කරනු ලැබ ඇත.

**6.1.9. "හඳුනාගත් ඉදිකිරීම් වැඩකරුවන්" ලියාපදිංචිය**

මීට අදාළ නීති රෙගුලාසි කෙටුම්පත් නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය වෙත යොමු කර එමඟින් මෙම නීති රෙගුලාසි 2014 අංක 33 දරණ පනතේ ප්‍රතිපාදනයන්ට යටත්ව ගැසට් කිරීම සඳහා නීති කෙටුම්පත් දෙපාර්තුමේන්තුවේ එකඟතාවය ලබා ගැනීම සඳහා එම කාර්යාල වෙත යොමුකරන ලදි.

**i.** බේරුම්කරණය සඳහා ක්‍රමවේදයන් ස්ථාපිත කිරීම -

2016 වසර තුළ නීති සහ රෙගුලාසි සාර්ථකව සකස් කරන ලදි.

**ii.** පරිසරය සහ මහජන සෞඛ්‍ය පිළිබඳව නීති රෙගුලාසි ස්ථාපනය කිරීම.

2016 වසර තුළ නීති සහ රෙගුලාසි සාර්ථකව සකස් කරන ලදි.

iii. සදාචාර ප්‍රතිපත්ති සහ සමාජ ප්‍රමිතීන් සඳහා නීති සහ රෙගුලාසි ස්ථාපනය කිරීම.

2016 තුළ නීති සහ රෙගුලාසි සාර්ථකව සකස් කරන ලදි.

iv. බේරුම්කරණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව

2016 වසරේදී බේරුම්කරණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව සාර්ථකව පවත්වනු ලැබූ අතර විභාගය 2017 පෙබරවාරි මසදී පැවැත්වීමට නියමිතය.

## 6.2. සංවර්ධන අංශය

### 6.2.1. ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන් සඳහා ජාතික ලියාපදිංචි කිරීමේ සහ ශ්‍රේණිගත කිරීමේ පරිපාටිය.

කිසියම් කොන්ත්‍රාත්කරුවෙකුට කොන්ත්‍රාත්තුවක් පිළිබඳව නිසි වර්ගීකරණයක් නොකර විවිධ ප්‍රමාණයේ සහ වර්ගයේ ව්‍යාපෘති ක්‍රියාවට නැංවීම සඳහා පවතින සාමාන්‍ය හැකියාව හෙවත් ශාක්‍යතාවය මැන බැලීමේ ක්‍රමවේදයන් ලියාපදිංචිය සහ වර්ගීකරණය කොන්ත්‍රාත්කරුගේ තාක්‍ෂණ හා මූල්‍ය තත්ත්වය පරීක්‍ෂා කිරීම මඟින් ලියාපදිංචිය සහ වර්ගීකරණය කිරීම තීරණය කෙරේ.
2016 වසර තුල නව ලියාපදිංචි කිරීම් 2476 ක් නිකුත් කළ අතර කොන්ත්‍රාත්කරුවන් 413 දෙනෙකුගේ ශ්‍රේණි ඉහළ දමා ඇත. එසේම ලියාපදිංචිය අලුත් කිරීම් 591 ක් ද සිදුකරන ලදි.

ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන් [ප්‍රධාන (ගොඩනැගිලි සහ සිවිල්), විශේෂ (විද්‍යුත් යාන්ත්‍රික), විශේෂ (නිමැවුම සහ අනෙකුත් විශේෂ කාර්යයන්)] සඳහා ලියාපදිංචිය සිදුකිරීමට අදාළ මාර්ගෝපදේශනයේ වැදගත් සංශෝධන කිහිපයක් සිදුකර 2017 වසරේ ජනවාරි මසදී ඉදිකිරීම් ක්ෂේත්‍රයේ යහපත තකා ප්‍රකාශයට පත් කිරීමට නියමිතය.

- ***වෙබ් අඩවිය පාදක වූ කොන්ත්‍රාත්කරුවන්ගේ ලියාපදිංචිය නිරීක්‍ෂණ කිරීමේ ක්‍රමවේදය***
    - ***I. ඉදිකිරීම් කර්මාන්තය සඳහා අධීක්ෂණ ක්‍රමය ( CCPMS)***
    - ***II. ජාතික ඉදිකිරීම් කර්මාන්ත තොරතුරු පද්ධතිය (NCIIS)***

### *I. ඉදිකිරීම් කර්මාන්තය සඳහා අධීක්ෂණ ක්‍රමය ( CCPMS )*

*CCPMS* මෙය භාවිතයට පහසු මාර්ග ගත නිරීක්‍ෂණ පද්ධතියකි.
මෙම ක්‍රියාවලිය මහබැංකු අරමුදල් යොදවා ක්‍රියාත්මක කර ඇති මාර්ගගත ලියාපදිංචිය ඉදිකිරීම් කර්මාන්තයේ නියැලී සිටින පාර්ශවයන්ගේ දැඩි අවශ්‍යතාවයක්ව පැවතුනකි. සියළුම පාර්ශවකරුවන් නිරීක්‍ෂණය කිරීමේ අවශ්‍යතාවය ඉටුකර ගත හැකි විය.

2014 අගෝස්තු මස සිට C1 ශ්‍රේණියේ කොන්ත්‍රාත්කරුවන් සඳහා මෙම ක්‍රමය යටතේ ලියාපදිංචිය අනිවාර්ය කර තිබේ. එමෙන්ම 2015 පෙබරවාරි මස සිට C2 සහ C3 ශ්‍රේණි සඳහාද මෙහි ලියාපදිංචිය අනිවාර්ය කර තිබේ.

### *II. ජාතික ඉදිකිරීම් කර්මාන්ත තොරතුරු පද්ධතිය (NCIIS)*

ශ්‍රී ලංකාවේ ඉදිකිරීම් ක්ෂේත්‍රයේ ක්‍රියාකාරකම්හි ප්‍රගතිය නිරීක්‍ෂණය සහ වාර්තා කිරීම අරමුණු කොට වර්ධනය කරන ලද්දා වූ වෙබ් පෝටලය NCIIS වේ. එහි ඕනෑම අයෙකුගේ භාවිතය සඳහා අවශ්‍ය වන්නා වූ කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචිය සඳහා වන ජාතික දත්ත, ඉදිකිරීම් කර්මාන්ත රෙගුලාසි, ඉදිකිරීම් සඳහා අදාළ වන පර්යේෂණ සහ සංවර්ධනය ආදිය පිළිබඳ තොරතුරු අන්තර්ගතය. තවදුරටත් ජාත්‍යන්තර දත්ත පිළිබඳව දැනගැනීමට පාදක වන්නා වූ විශ්වාසනීය මාර්ගයයන් වශයෙන්ද මෙය හැඳින්විය හැක. ඉදිකිරීම් කර්මාන්තයට දායක වන්නා වූ සාධකයන්හි උච්චාවචනයන්, රජයේ ව්‍යවස්ථාවන්, නීති සහ රෙගුලාසි මෙන්ම කොන්ත්‍රාත් කාර්ය සාධනය යනාදි කරුණු වලට අනුකූලව මෙය නිරන්තරයෙන් වර්ධනය කරනු ඇත.

මෙම වෙබ් අඩවියේ පෝටලයේ සංවර්ධන කටයුතු වැඩි වශයෙන් සිදුකරන ලද්දේ 2015 වසරේ දීය. දත්ත එක්රැස් කිරීමේ යාන්ත්‍රණය 2016 වසරේදී සංවර්ධනය කොට ගැසට් කිරීම සඳහා යොමු කරන ලදි.

මෙම පෝටලය අන්තර්ජාතික ඉදිකිරීම් ප්‍රජාවගේ ජාතික සේවාවන් වශයෙන් ශ්‍රී ලංකාවේ වඩාත් ඵලදායී හා කාර්යක්ෂම කර්මාන්තයන් පවත්වා ගෙන යාම පෙරදැරිව 2016 වසරේ පළමු කාර්තුව තුළ ජාලගත කිරීම සැලසුම් කර තිබුණි.

### 6.2.2 ඉදිකිරීම් විශිෂ්ටතාවය සඳහා සිඩා (CIDA) සම්මාන

ඉදිකිරීම් කර්මාන්තය සම්බන්ධයෙන් වෘත්තිමය භාවය සහ විශිෂ්ටතාවය ප්‍රවර්ධනය කරමින් 1990 වසරේදී ආරම්භ කෙරුණු වාර්ෂික සම්මාන ප්‍රදාන වැඩ පිළිවෙල 27 වන වරටත් අඛණ්ඩව 2016 වසරේදී පවත්වන ලදි. මෙම ඉදිකිරීම් සම්මාන ප්‍රදාන වැඩ පිළිවෙල මගින් ඉදිකිරීම් කළමනාකරණයේ විශිෂ්ඨ කුසලතාවය, තාක්‍ෂණික හා තත්ත්ව නිපුණතාවයෙන් යුත් උසස් වෘත්තීමය භාවය, නම්‍ය හා යෝග්‍ය තාක්‍ෂණය හඳුන්වාදීම හා වෘත්තීය කාර්මිකයින් පුහුණුව සඳහා සහභාගිත්වය ආදිය හඳුනාගෙන ඒවා ඇගයීමට ලක් කරනු ලැබේ.

2016 වසර තුළදී වැඩබිම් පරීක්‍ෂණ 45 ක් ද/කමිටු රැස්වීම් ද පවත්වා ඇත. ඉදිරිපත් කිරීම් 3 ක් වසර අගදී පැවැත් වූ අතර CIDA සහ NCASL එකමුතුවෙන් බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවෙහි පැවැත් වූ 2016 සම්මාන ප්‍රදානෝත්සවයේදී සම්මාන ප්‍රදානය කරන ලදි. දිවයින පුරා විහිදී සිටින ඉදිකිරීම් ශිල්පීන්ගේ සැඟ වී ඇති කුසලතා උකහා ගැනීම සඳහා යොදාගෙන ඇති සංකල්පයන් වශයෙන් ඉදිකිරීම් සඳහා ජාතික සම්මාන ප්‍රදානය හඳුන්වා දිය හැක. මෙය පොදු උත්සවයක් බවට පත්කරමින් ඉදිකිරීම් කර්මාන්තය සඳහා විශාල දායකත්වයක් සැපයූ වෘත්තියවේදීන් සහ විශිෂ්ට පුද්ගලයින් හඳුන්වාදීම සඳහා වූ වැඩසටහනක් ලෙස සම්මාන ප්‍රදානෝත්සවය හඳුන්වා දිය හැක.

**ඉදිකිරීම් විශිෂ්ටතාවය සඳහා ජාතික සම්මාන ප්‍රදානය – 2016**
**ජයග්‍රාහකයින් - ගොඩනැගිලි අංශය**

| සම්මාන වර්ගය | ව්‍යාපෘතිය සහ ලබන්නා | කොන්ත්‍රාත්කරු |
|---|---|---|
| විශිෂ්ටතා සම්මානය | ආරක්‍ෂක සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශය, බත්තරමුල්ල පෞද්ගලිකව හඳුනාගැනීම සඳහා මහලේකම් කාර්යාලය සැලසුම් කිරීම සහ ඉදිකිරීම | ඉන්ටර්නැෂනල් කන්ස්ට්‍රක්ෂන් කොන්සෝටියම් (පුද්) සමාගම. |
| විශිෂ්ටතා සම්මානය | සුබෝපභෝගී නිවාස සංකීර්ණය අංක 320, යූනියන් පෙදෙස, කොළඹ 02. | සන්කෙන් කන්ස්ට්‍රක්ෂන් (පුද්) සමාගම |
| විශිෂ්ටතා සම්මානය | කොළඹ නගරයේ අඩු පහසුකම්ලාභී වාසස්ථාන හිමිකරුවන් සඳහා නිවාස. | ඇක්සස් ඉංජිනේරු (පුද්) සමාගම. |
| විශිෂ්ටතා සම්මානය | අයිස්ලන්ඩ් ව්‍යාපාරික මධ්‍යස්ථානය, කොළඹ 03 සැලසුම් කිරීම සහ ඉදිකිරීම | ඉන්ටර්නැෂනල් කන්ස්ට්‍රක්ෂන් කොන්සෝටියම් (පුද්) සමාගම |

| | | |
|---|---|---|
| විශිෂ්ටතා සම්මානය | බොටලින් ප්ලාන්ට් සංකීර්ණය, මුනිදාස කුමාරතුංග මාවත, කොළඹ 03 | ආර්. එන් කන්ස්ට්‍රක්ෂන්ස් (පුද්) සමාගම |
| විශිෂ්ටතා සම්මානය | කොමර්ෂල් බිල්ඩින්ග් ඩයලොග් ආසියාටා (පුද්) සමාගම අංක 475 ඒ, යූනියන් පෙදෙස, කොළඹ 02. | තුඩාවේ බ්‍රදර්ස් (පුද්) සමාගම |
| විශිෂ්ටතා සම්මානය | බත්තරමුල්ල ආරක්ෂක සහ නාගරික සංවර්ධන අධිකාරියේ මහලේකම් කාර්යාලයට ඇළුමිනියම් දොරවල් ජනෙල් සවිකිරීම සහ සැපයීම, කොම්පොසයිට් පැනල්ස්, ඇතුලු වීමේ පිවිසුම් මග සහ පියැසි වහල | ඇජැන්ස් ඉංජිනේරු (පුද්) සමාගම |
| කුසලතා | මහල් නිවාස සංකීර්ණය, ෆෙයාර් වේ ස්කයි ගාඩන් අංක 39, පෙරේරා මාවත, රාජගිරිය. | මාගා ඉංජිනේරු (පුද්) සමාගම |
| කුසලතා | අධිවේගී මාර්ග මහලේකම් කාර්යාලය, බත්තරමුල්ල | නවලෝක ඉදිකිරීම් (පුද්) සමාගම |
| කුසලතා | මහල් 6න් යුත් සමුපකාර ආරෝග්‍යශාලා ගොඩනැගිල්ල ගාල්ල | ශ්‍රීපාලි කොන්ත්‍රාත් (පුද්) සමාගම |
| කුසලතා | මහජන බැංකු ශාඛා කාර්යාලය හතරලියැද්ද නුවර | කෙම්යෝ (පුද්) සමාගම |

**<u>ඉදිකිරීම් කාර්ය සාධනය සඳහා ජාතික සම්මාන -2016</u>**

**<u>ජයග්‍රාහකයින් - සිවිල් ඉංජිනේරු අංශය</u>**

**කාර්ය සාධන සම්මාන**

**<u>වර්ගය I –රු. මිලියන 1000 කට වැඩි වටිනාකම</u>**

| අනු අංකය . | ව්‍යාපෘතියේ නම | කොන්ත්‍රාත්කරු |
|---|---|---|
| 1 | බොඩගම – හම්බෙගමුව – කල්තොට මාර්ගය වැඩි දියුණු කිරීම (B 528) (0+000 සිට 48+200 කි. මී.දක්වා කොන්ත්‍රාත් අංකය ආර් ඩී ඒ/ඩී ඩබ් /ඌව /එල් එල් බී එෆ් පී /2011/392 | මාගා ඉංජිනේරු (පුද්)සමාගම |
| 2 | බිංගදෙනිය – ඇදිගම – ආනමඩුව (බි 45) මාර්ගය (0+000 සිට 38+000 කි මි දක්වා) ප්‍රතිසංස්කරණය සහ වැඩි දියුණුව කොන්ත්‍රාත් අංකය ආර් ඩී ඒ / ඩි ඩබ්/එන්ඩබ්පි/ජීඕඑස්එල්/2011/347 ඒ | ඇක්සස් ඉංජිනියරින් (පුද්) සමාගම. |
| 3 | කුරුණෑගල - මාදම්පේ - නාරම්මල මාර්ගය පුනරුත්ථාපනය සහ වැඩි දියුණුව (40+870 සිට 64-770 කි මි දක්වා) කොන්ත්‍රාත් අංකය ආර්ඩිඒ/ඩිබේ/එන්ඩබ්පි/එල්බිඑෆ්පි/2011/753 බි | නෙම් ඉදිකිරීම් (පුද්) සමාගම. |

| | | |
|---|---|---|
| 4 | ජාතික අධිවේගී මාර්ග වස්කඩුව – බණ්ඩාරගම මාර්ගය (බී – 458) (0+000 සිට 12+070 කි මි ) සහ කැස්බෑව – කිදෙල්පිටිය – බණ්ඩාරගම මාර්ගය (බී 216) (0+000 සිට 11+780 කි මි) දක්වා දේශීය කොන්ත්‍රාත්කරුවන් මගින් පුනරුත්ථාපනය<br>කොන්ත්‍රාත් අංකය ආර්ඩිඒ/ඩිඩබ්/ඩබ්පි/ජීඕඑස්එල්/2011/453 | කේ. ඩී. ඊබට් ඇන්ඩ් සන්ස් හෝල්ඩින්ග්ස් (පුද්) සමාගම |
| 5 | පන්නල - කුලියාපිටිය මාර්ගය (බී 356) (5.0 – 16.28 කි මි) සහ කුලියාපිටිය – හෙට්ටිපොල මාර්ගය (බී 243) (0.00 සිට 25.69 කි. මි.) දක්වා පුනරුත්ථාපනය<br>කොන්ත්‍රාත් අංකය:<br>ආර්ඩිඒ/ඩිඩබ්/එන්ඩබ්පි/ජීඕඑස්එල්/2011/425 | නෙම් ඉදිකිරීම් (පුද්) සමාගම |
| 6 | මාතර – හක්මන මාර්ග ව්‍යාපෘතිය පුළුල් කිරීම සහ නැවත ඉදිකිරීම (0+000 සිට + 24+240 කි. මි.) දක්වා<br>කොන්ත්‍රාත් අංකය ආර්ඩිඒ/ඩිඩබ්/එන්පි/ජීඕඑස්එල්/2012/10 | මාගා ඉංජිනේරු (පුද්) සමාගම |
| 7 | අළුත්ගම සිට දක්ෂිණ අධිවේගී මාර්ගයේ බී – 157 බටහිර මාර්ග කොටස් (42+600 සිට 53+670 කි. මි.) පුනරුත්ථාපනය සහ අලුත්වැඩියාව කොන්ත්‍රාත් අංකය:<br>ආර්ඩිඒ/එන්එච්එස්පි/අයිසිබී/ඒඩිබී/සිපි-3 | කේ. ඩී.ඒ. වීරසිංහ (පුද්) සමාගම |
| 8 | ගාල්ල - දෙනියාය – මාදම්පේ මාර්ග කොටස රක්වාන සිට මාදම්පේ දක්වා (130+000 සිට 143+930 කි මි දක්වා) පුනරුත්ථාපනය සහ වැඩිදියුණුව<br>කොන්ත්‍රාත් අංකය ආර්ඩිඒ/එම්එෆ්ඒපි/අයි පී බී/ඕපීඅයිඩී 1-01 | මාගා ඉංජිනේරු (පුද්) සමාගම |
| 9 | කුරුණෑගල - නාරම්මල - මාදම්පේ මාර්ගය පුනරුත්ථාපනය සහ වැඩි දියුණුව (22+260 සිට 40+870 කි මි) කොන්ත්‍රාත් අංකය ආර්ඩිඒ/ඩිඩබ්/එන්ඩබ්පි/එල්බීඑෆ්පි/2011/753ඒ | කන්සල්ටින් ඉන්ජිනියර්ස් ඇන්ඩ් කන්ට්‍රැක්ටර්ස් ප්‍රයිවට් ලිමිටඩ් |
| 10 | ගලගෙදර – රඹුක්කන මාර්ගය පුනරුත්ථාපනය සහ වැඩි දියුණුව (0.0 සිට 18.50 කි මි දක්වා)<br>කොන්ත්‍රාත් අංකය ආර්ඩිඒ/ආර්එන්අයිපි/පීආර්පි2/ පැකේජ් – පි/ පි 7 (iii) | ඇක්සස් ඉංජිනියර්ස් පුද්ගලික සමාගම |
| 11 | A001 කොළඹ - නුවර මාර්ගයේ පෑලියගොඩ සිට කිරිබත්ගොඩ දක්වා කොටස (5+860-13+100 කි මි) පුනරුත්ථාපනය සහ වැඩි දියුණුව<br>කොන්ත්‍රාත් අංකය ආර්ඩිඒ/එම්ඪඒපි/අයිපිබී/එම්එෆ්ඩී-2/07 | මාගා ඉංජිනේරු පුද්ගලික සමාගම |

| | | |
|---|---|---|
| 12 | කොළඹ මහනගර නාගරික සංවර්ධන ව්‍යාපෘතිය ලිබර්ටි වට රවුමේ සිට ධර්මපාල මාර්ගයේ හන්දිය දක්වා ගාලු පාර සහ ආර්.ඒ.ඩී. මෙල් මාවත පුනරුත්ථාපනය<br>කොන්ත්‍රාත් පැකේජය C<br>කොන්ත්‍රාත් අංකය එම් සි යු ඩිපි/සි එම් සි /ඩබ්/12 (සි) | ඉන්ටර්නැෂනල් කන්ස්ට්‍රක්ෂන්ස් කොන්සෝටියම් (පුද්) සමාගම |
| 13 | කොළඹ මහනගර සංවර්ධන ව්‍යාපෘතිය බම්බලපිටිය හන්දියේ සිට සවුත් සිටි ලිවිට් දක්වා කොටස පුනරුත්ථාපනය<br>පැකේජය B<br>කොන්ත්‍රාත් අංකය එම්සියුඩිපි/සිඑම්සි/ඩබ්/12 (බි) | ඉන්ටර්නැෂනල් කන්ස්ට්‍රක්ෂන්ස් කොන්සෝටියම් (පුද්) සමාගම |

**වර්ගය ii – මිලියන 500 සහ මිලියන 1000 අතර වටිනාකම**

| අනු අංකය | ව්‍යාපෘතියේ නම | කොන්ත්‍රාත්කරු |
|---|---|---|
| 1 | A029 වවුනියාව – හොරොව්පතාන මාර්ගය පුනරුත්ථාපනය සහ වැඩි දියුණු කිරීම (24+000 කි මි සිට 34+950 කි මි දක්වා)කොන්ත්‍රාත් අංකය ආර්ඩිඒ/එන්ආර්සීපී(ඒඑෆ්/අයිසීබී/ඒඩීබී/සීපී -11 | ඉන්ටර්නැෂනල් කන්ස්ට්‍රක්ෂන්ස් කොන්සෝටියම්(පුද්) සමාගම |
| 2 | කොළඹ මහනගර සංවර්ධන ව්‍යාපෘතිය ගාළු පාර සහ ආර් ඒ ඩී මෙල් මාවත පුනරුත්ථාපනය ගලධාරි වටරවුමේ සිට කොල්ලුපිටිය හන්දිය දක්වා<br>කොන්ත්‍රාත් පැකේජය ඒ<br>කොන්ත්‍රාත් අංකය එම්සීයූඩීපී/සීඑම්සී/ඩබ්/12 (ඒ) | ඉන්ටර්නැෂනල් කන්ස්ට්‍රක්ෂන්ස් කොන්සෝටියම්(පුද්) සමාගම |
| 3 | පොල්දූව පාලම සැලසුම් කිරීම සැපයීම සහ ඉදිකිරීම<br>කොන්ත්‍රාත්අංකය ආර්ඩීඒ/යූකේඑස්බිපි2/පීඑල්ඩිඩබ්/006 | ඇක්සස් ඉංජිනියරින්ස් |
| 4 | කඳාන ජලපිරිපහදු යන්ත්‍රාගාරය පුළුල් කිරීම<br>කොන්ත්‍රාත් අංකය ඩබ්එස්ඩිපි/කේජීඩබ්එස්පි – පී 1 එස් 2 / අයිපීබී – 01 | ඇක්සස් ඉංජිනියරින්ස් |

**වර්ගය iii වටිනාකම රු මිලියන 100 සහ 500 අතර කොන්ත්‍රාත්කරු**

| අනු අංකය | ව්‍යාපෘතියේ නම | කොන්ත්‍රාත්කරු |
|---|---|---|
| 1 | ඉහල එසවූ ජල කුළුනු ඉදිකිරීම කාර්යාල ගොඩනැගිල්ල නිවාස ගබඩා සහ සැපයුම ඉච්චලම්පත්තු ජල සැපයුම් ව්‍යාපෘතියේ විකාශණ නාලය ඇතිරීම සහ නල බෙදාහැරීම<br>කොන්ත්‍රාත්අංකයපීඇන්ඩ්ඩි/එස්ඊ/ඒඩිබි/සීඒආර්ෆ්/ඊපි/2011/01 | කේ. ඩී. ඒ. විරසිංහ සහ පුද්ගලික සමාගම |
| 2 | ඒඩීබී ආධාර මත උතුරුකරයේ මාර්ග සම්බන්ධීකරණ ව්‍යාපෘතිය – අමතර වියදම් (ප්‍රාදේශීය ඒකකය)- ඒඩීබී ණය අංකය 2890 (එස්එෆ්)2891 (ශ්‍රී)<br>කොන්ත්‍රාත් අංකය එන්ආර්සිපි/එන්පි/එන්සිබි/කේඑල්02 | මාගා ඉංජිනියරින්ස් (පුද්) සමාගම |
| 3 | ඒඩීබී ආධාර මත උතුරු කරයේ මාර්ග සම්බන්ධීකරණ ව්‍යාපෘතිය - අමතර වියදම් (ප්‍රාදේශීය ඒකකය)<br>කොන්ත්‍රාත් අංකය එන්ආර්සීපී/එන්පී/එන්සීබී/එම්යු02 | මාගා ඉංජිනියරින්ස් (පුද්) සමාගම |

| | | |
|---|---|---|
| 4 | ඒ 019 පොල්ගහවෙල - කෑගල්ල මාර්ගයේ පාලම් අංක 3/2 (කරදාන පාලම) නැවත ඉදිකිරීම<br>කොන්ත්‍රාත් අංකය ආර්ඩීඒ/එම්එෆ්ඒපී/අයිසීබී/ඕඑෆ්අයිඩී-1/03 | වී.වී කරුණාරත්න සහ සමාගම |
| 5 | නව ලක්ෂපාන විදුලිබල උමගෙහි අලුත්වැඩියා කටයුතු<br>කොන්ත්‍රාත් අංකය ඩීඑස්ඩබ්ආර්පිපි-ඒ-එෆ්/වර්ක්ස්/ඩිපි/151 | රාජ්‍ය සංවර්ධන සහ ඉදිකිරීම් සමාගම |

**නව ඉදිකිරීම් ශිල්ප සඳහා සම්මාන – 2016**

| අනු ංකය | ව්‍යාපෘතියේ නම | කොන්ත්‍රාත්කරු |
|---|---|---|
| 1 | කෝන් ඔය හරහා ද්‍රෝණියක් තැනීම<br>කොන්ත්‍රාත් අංකය අයිඩී/එච්ඕ/ඩීඔආර්පී/01,02,03/2010 | සංවර්ධන සහ ඉදිකිරීම් සමාගම |

### 6.2.3. සේවාදායකයන්ගේ පැමිණිලි විසඳීම

ගොඩනැගිලි දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා ජාතික ඉදිකිරීම් සංගමය (NCASL) සහ (CIDA) යන ආයතනයන්ගේ සාමාජිකයින්ගෙන් සමන්විත මූලික විමර්ශණ මඩුල්ලක් කොන්ත්‍රාත්කරුවන්ගේ පැමිණිලි විමර්ශනය කිරිම සඳහා ස්ථාපිත කර ඇත.

**වසර 2016**

| විස්තරය | ආරවුල් 2016 |
|---|---|
| සිඩා (CIDA) තොරතුරු සඳහා පමණක් | 18 |
| කොන්ත්‍රාත්කරුවන්ගෙන් නිදහසට කරුණු විමසීම සහ ඒ සඳහා ඔවුන්ගෙන් ලැබෙන්නා වූ පිළිතුරු | 55 |
| විසඳා අවසන් ගැටළු | 21 |
| ඉදිරියේදී සිදුකිරීමට තිබෙන්නා වූ පරීක්ෂණ | 03 |
| **එකතුව** | 97 |

### 6.2.4. ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ ජර්නලය – 2016

2015 වසර සඳහා වන සිඩා (CIDA) ජර්නලය 2016 දෙසැම්බර් මස පවත්වන ලද ඉදිකිරීම් සඳහා වන ජාතික සම්මාන ප්‍රදානෝත්සවයේදී ප්‍රකාශයට පත්කොට එළිදක්වන ලදි. ඉදිකිරීම් කර්මාන්තයට අදාළ ගැටළු පිළිබඳ තොරතුරු බෙදාහැරීම මෙහි අරමුණ වේ. ඉදිකිරීම් කර්මාන්තයේ වර්ධනයට ඉවහල් වන්නා වූ ලිපි සහ තොරතුරු මෙමඟින් ප්‍රකාශයට පත් කරයි.

ඉදිකිරීම් ක්ෂේත්‍රයේ නියැදෙන්නන් හා වෘත්තිකයන්ගේ උපරිම සහයෝගයෙන් හා කැපවීමෙන් ඉක්ටාඩ්/සිඩා ඉතිහාසයේ 7 වන වරටත් මෙම ජර්නලයේ 14 වන ප්‍රකාශය ජාත්‍යන්තරව පිළිගත් ජර්නලයක් ලෙස ප්‍රකාශයට පත් කරන ලදි.

### 6.2.5. ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ තොරතුරු තාක්ෂණ පද්ධතිය

පහත සඳහන් අත්‍යවශ්‍ය අංගයන්ගෙන් සමන්විතව තොරතුරු තාක්ෂණ පද්ධතිය සහ වෙබ් අඩවිය සතුටුදායක මට්ටමින් පවත්වාගෙන යනු ලැබේ.

i. සීසීපීඑම්එස් (කොන්ත්‍රාත්කරුවන්ගේ ජාල පදනම් ලියාපදිංචිය නිරීක්ෂණ පද්ධතිය) ලියාපදිංචි නොවූ කොන්ත්‍රාත්කරුවන් සහ ආරවුල් වලට සම්බන්ධ පුද්ගලයන් හඳුනාගැනිම සඳහා ක්‍රියා මාර්ගයන් හඳුන්වාදීම.
ii. ඇගයීම් ගොනුවල දත්ත පවත්වාගැනීම සහ ප්‍රගතිය නිරීක්ෂණය කිරිම සඳහා වැඩසටහනක් වැඩි දියුණු කිරීම.
iii. කඩිනමින් ලියාපදිංචිවීම් සිදුකිරීම සඳහා කුවිතාන්සියක් මුද්‍රණය කර නිකුත් කිරීමේ වැඩසටහන හඳුන්වා දීම සහ එය පවත්වාගෙන යාම.
iv. සිඩා (CIDA) ප්‍රධාන කාර්යාලයේ මූල්‍ය අංශයට CEOTC, CETRAC,CHPB යන අංශ සම්බන්ධ කිරීමට මධ්‍යගත නව දත්ත සේවරයන් හඳුන්වා දීම .
v. 'ඉක්ටාඩ්' ඩෝමේනය 'සිඩා' යන නාමයට වෙනස් කර ඒ අනුව ඊ මේල් ලිපිනය ද වෙනස් කිරීම.
vi. සෑම මාසයක්ම අවසානයේ දත්ත සීමාව ඉක්මවීමේ ගැටළුව විසඳීම සඳහා අන්තර්ජාලයට ප්‍රවිශ්ට වීම උපාංගකරණය සහ සිඩා (CIDA) ජාල පද්ධතිය සඳහා ෆයර් වෝල් එකක් සවිකිරීම.

### 6.2.6. 2016 වසරේ පැවැත්වූ සම්මන්ත්‍රණ/සමුළු/වැඩමුළු

ඉදිකිරීම් කර්මාන්තයේ නියැළි පාර්ශවකරුවන්ගේ හැකියාවන් සහ ශක්තිය නිරතුරුව වර්ධනය කිරීම උදෙසා මෙම වසර තුලදී සාර්ථකව පහත සඳහන් වැඩසටහන් පවත්වන ලදි.

- ''ඉදිකිරීම් ඇස්තමේන්තු සහ පෙර සැකසූ කොන්ක්‍රීට් පිළිබඳව'' සම්මන්ත්‍රණය– 2016 ජනවාරි 22
- ''ඉදිකිරීම් බිම්වල ආරක්ෂාව'' පිළිබඳ සම්මන්ත්‍රණය –2016 පෙබරවාරි 19
- ''වරගැන් වූ කොන්ක්‍රීට් සහ ඉදිකිරීම් පිරිවැය කැටහෙනරනය'' පිළිබඳ සම්මන්ත්‍රණය – 2016 අප්‍රේල් 1
- ''ඉහලට එස වූ ගොඩනැගිලි වල ඇලුමිනියම් සහ ජලනල එළීමේ වැඩ '' –2016 ඔක්තෝබර් මස 7
- (නාගරික සංවර්ධනය පිළිබඳ ගොඩනැගිලි සහ සැලසුම් නියාමනය පිළිබඳ කෙටි කාලීන පාඨමාලා – 2016 අගෝස්තු මස 5, 12 සහ 19
- කොන්ක්‍රීට් පිළිබඳ කෙටි කාලීන පාඨමාලා – 2016 ජූනි මස 3 10 සහ 17
- ''ඉදිකිරීම් කර්මාන්ත පර්යේෂණ පිළිබඳ බුද්ධි කලම්බනය පිළිබඳ වැඩමුළුව'' – (1) 2016 ජූනි 23
- ''ඉදිකිරීම් කර්මාන්ත පර්යේෂණ පිළිබඳ බුද්ධි කලම්බනය පිළිබඳ වැඩමුළුව'' – (11)2016 ජූලි 14
- ''ඉදිකිරීම් වැලි පිළිබඳ දත්ත පද්ධතිය පිලිබඳ වැඩ සටහන'' – 2016 ජූලි 15
- එම් සැන්ඩ් පිළිබඳ වැඩ සටහන – සීඩීර් (පුද්ගලික) සමාගම – 2016 අප්‍රේල් 28

### 6.2.7. සීබීඕ වැඩ සටහන්

i. දිස්ත්‍රික් ලේකම් කාර්යාලය – නුවර – 2016 පෙබරවාරි 18
ii. දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - ගම්පහ – 2016 පෙබරවාරි 26
iii. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය – අඹගමුව කෝරලය – 2016 මාර්තු 11
iv. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - ගිරිබෑව – 2016 මාර්තු 24
v. දිස්ත්‍රික් ලේකම් කාර්යාලය – කළුතර – 2016 අප්‍රේල් 08

vi. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය – නොච්චියාගම – 2016 අප්‍රේල් 25
vii. දිස්ත්‍රික් ලේකම් කාර්යාලය – මාතර – 2016 මැයි 10
viii. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය – මිහින්තලය - 2016 ජුනි 03
ix. දිස්ත්‍රික් ලේකම් කාර්යාලය – අම්පාර – 2016 ජුනි 24
x. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය – දෙහිඅත්තකණ්ඩිය – 2016 අගෝස්තු 11

මෙම වැඩසටහන්/වැඩමුළු පැවැත්වීම සිදුකරනු ලබන්නේ ඉදිකිරීම් කර්මාන්තයට අදාල තොරතුරු ව්‍යාප්ත කිරීමේ අරමුණු පෙරදැරි කර ගෙනය.

### 6.3. විද්‍යුත් යාන්ත්‍රික සේවා අංශය

විද්‍යුත් යාන්ත්‍රික සේවා අංශයෙහි මෙහෙවර වන්නේ, ඉදිකිරීම් කර්මාන්තයෙහි සැලකිය යුතු ඵලදායිතාවයන් ළඟාකර ගැනීම සඳහා එම කර්මාන්තයේ නියැළී සිටින ශ්‍රම බලකායෙහි වර්ධනය අරමුණු කොට ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ ක්‍රියාකරවීම, නඩත්තුව සහ ඒවා කළමනාකරණය කිරීමට අදාළ වන දැනුම සහ කුසලතාවයන් ලබා දීමයි.

**විද්‍යුත් යාන්ත්‍රික සේවා අංශයෙහි අරමුණු වන්නේ :**

I. ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ කාර්මිකයින් සහ ක්‍රියාකරුවන් හට තමතමන්ගේ කාර්යය කාර්යක්ෂමව සහ ඵලදායිතාවයෙන් යුක්තව කරගෙන යාමට අවශ්‍ය හැකියාවන් නංවාලීම.

II. ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ අධීක්ෂණ සහ කළමනාකරණ කාර්ය මණ්ඩලයට තම රාජකාරිය කාර්යක්ෂමතාවයකින් සහ ඵලදායිතාවයකින් යුතුව ඉටුකිරීමට හැකිවන අයුරින් ඔවුන්ගේ හැකියාවන් වර්ධනය කිරීම.

III. ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ භාවිතය වැඩිදියුණු කරමින් ඒවා භාවිතා කරන්නන් අතර නිසියාකාර නඩත්තු පරිචයන් ඇති කිරීම මඟින් අලුත්වැඩියා පිරිවැය සහ ඒ සඳහා වැයවන කාලය අවම කර ගැනීම.

IV. ඉදිකිරීම් කර්මාන්තයට අවතීරණ වන ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ කාර්මිකයින් සහ ක්‍රියාකරුවන් හට නිසියාකර මූලික පුහුණුවක් ලබාදීම.

V. ඉදිකිරීම් පුහුණු මධ්‍යස්ථානයේ ආදර්ශ වැඩමුළු සඳහා අවශ්‍ය පුහුණුව ලබාදීම මඟින් ඉදිකිරීම් උපකරණ අලුත්වැඩියා වැඩබිම්වල තත්ත්වය ඉහල නැංවීම සඳහා දායක වීම.

VI. ශ්‍රී ලංකාවේ ඉදිකිරීම් උපකරණ කාර්මිකයින් සහ ක්‍රියාකරුවන්ගේ සමාජ පිළිගැනීම ප්‍රවර්ධනය කිරීම.

සිඩා (CIDA) හි විද්‍යුත් යාන්තික්‍ර සේවා අංශය කොටස් දෙකකින් සමන්විත වේ. උදාඃඉදිකිරීම් යන්ත්‍ර මෙහෙයුම් ශිල්පී විදුහල (CEOTC) සහ ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ පුහුණු මධ්‍යස්ථානය (CETRAC)



### 6.3. 1. ඉදිකිරීම් යන්ත්‍ර මෙහෙයුම් ශිල්පී මධ්‍යස්ථානය (CEOTC)

**දැක්ම :**

"ඉදිකිරීම් කර්මාන්තයේ නියැළී සිටින සියළුම පුහුණුකරුවන් සහ සේවාදායකයින් සඳහා ප්‍රමුඛ සේවාවක් ලබාදීමට කැපවුණු ශක්තිය තුළින් සහ ඉදිකිරීම් කර්මාන්තයට අවශ්‍ය නිපුණ ශ්‍රම බලකායන් සැපයීම මඟින් වඩාත් ප්‍රමුඛතාවයකින් යුතු රාජ්‍ය සංවිධානය බවට පත්වීම"

**මෙහෙවර:**

"ඉදිකිරීම් කර්මාන්තයේ කුසලතා බෙදාදීම සහ මෙහෙයුම් කටයුතු ලෙසද දැනුම, නඩත්තුව හා ඉදිකිරීම් උපකරණ කළමනාකරණය තුළින් දක්ෂ ශ්‍රම බලකායන් ඉදිකිරීම් ක්ෂේත්‍රය තුළ බිහිකිරීම සහ එමඟින් ඉදිකිරීම් නිෂ්පාදන ඵලදායිතාවයේ මිනිය හැකි වර්ධනයක් ලබා ගැනීම."

**අරමුණු:**




i. ස්ථාපිත ජාතික නිපුණතා තත්ත්වයට සමවන අයුරින් ඉදිකිරීම් උපකරණ ක්‍රියාකරුවන් පුහුණු කරවීම.
ii. යන්ත්‍ර සහ අධීක්ෂණ කළමනාකරණය පිළිබඳව පාඨමාලාවන් පැවැත්වීම.
iii. ඉදිකිරීම් උපකරණ ක්‍රියාකරුවන් සඳහා ජාතික වෘත්තීය පරීක්ෂණ සහ NVQ පරීක්ෂණ පැවැත්වීම.
iv. ඉදිකිරීම් උපකරණ ක්‍රියාකරවන්නන්හට තම කාර්ය කාර්යක්ෂමව සහ ඵලදායිතාවයෙන් යුතුව ඉටුකිරීම සඳහා ඔවුන්ගේ හැකියාවන් වර්ධනය කිරිම.
v. ඉදිකිරීම් කර්මාන්ත සඳහා යන්ත්‍ර සහ උපකරණ කුලියට දීම.
vi. රාජ්‍ය ඉදිකිරීම් ව්‍යාපෘතීන්හි පාර්ශවකරුවකු වශයෙන් නවක ක්‍රියාකරුවන්ට අත්දැකීම් ලබාගැනීම මෙන්ම ජාතික සංවර්ධනයට දායක වීම.

**හැඳින්වීම**

ඉදිකිරීම් උපකරණ ක්‍රියාකරුවන් පුහුණු කිරීමේ ආයතනය මඟින් ට්‍රෝලර් ට්‍රැක්ටර්, ලෝඩර්, එස්කැවේටර්ස්, මෝටර් ග්‍රේඩර්ස් වැනි ඉදිකිරීම් උපකරණ පිළිබඳ පුහුණු කිරීම් සිදුකරන අතර ඒවායේ ආරක්ෂාව, මූලික නඩත්තුව හා ක්‍රියාකරවීමේ තාක්ෂණය පිළිබඳව විශේෂ අවධානය යොමු කරයි. CEOTC අංශය ඉදිකිරීම් උපකරණ 56 ක ඇනියකින් ද ප්‍රමාණවත් පුහුණු නිලධාරීන් හා මාර්ගෝපදේශකයන්ගෙන් ද යුක්ත වේ. පුහුණුවන්නන්ගේ පුහුණු කාලයෙන් 70% ක් ප්‍රායෝගික පුහුණුව සඳහා ද 30% ක් න්‍යායික පුහුණුව සඳහා ද වෙන්කර ඇත. සමහර ඉදිකිරීම් උපකරණ කුලියට දීම තුළින් ආදායම් උපදවන අතරම පුහුණුවන්නන්ට රැකියා අවස්ථා ද එමඟින් ලබා දෙයි. CEOTC පුහුණු පාඨමාලාවන් ආයතනික පුහුණුව මෙන්ම රැකියා පුහුණුව යන දෙඅංශයෙන්ම සමන්විතය. ආයතනික පුහුණුව නිමකරන ලද පුහුණුකරුවෙකු අවම වශයෙන් තුන්මසක පුහුණුවක් ඉදිකිරීම් යන්ත්‍ර මෙහෙයුම් ශිල්පී මධ්‍යස්ථානයෙන් ලබාගැනීමෙන් අනතුරුව ඔහු හෝ ඇය ජාතික වෘත්තිය සුදුසුකම් සඳහා හිමිකම් දරයි. (NVQ) ඉදිකිරීම් උපකරණ ක්‍රියාකරුවන් සඳහා ජාතික වෘත්තීය පරීක්ෂණ සහ NVQ පරීක්ෂණ පැවැත්වීම සඳහා ජාතික ආධුනිකත්ව සහ කර්මාන්ත පුහුණු අධිකාරිය **(NAITA)** විසින් ඉදිකිරීම් යන්ත්‍ර මෙහෙයුම් ශිල්පී මධ්‍යස්ථානය **(CEOTC)** පිළිගෙන ඇත.

වර්තමානයේ දී ඉදිකිරීම් යන්ත්‍ර මෙහෙයුම් ශිල්පී මධ්‍යස්ථානය (CEOTC) මඟින් පවත්වාගෙන යනු ලබන පාඨමාලාවන්,

1. ප්‍රාථමික පුහුණුව
   1.1 මූලික ඉදිකිරීම් යන්ත්‍ර නඩත්තු ශිල්පය
2. කුසලතා වර්ධනය
   2.1 සැහැල්ලු ඉදිකිරීම් යන්ත්‍ර
   2.2 ඩම්ප් ට්‍රක්
   2.3 ෆාම් ට්‍රැක්ටර්
   2.4 සෙල්ෆ් ප්‍රොපෙල්ඩ් වයිබ්‍රේටිං රෝලර්

3. පස් ඉවත්කරන උපකරණ මූලික මොඩියුල
   3.1 ක්‍රෝලර් ට්‍රැක්ටර්
   3.2 වීල් ලෝඩර්
   3.3 මෝටර් ග්‍රේඩර්
   3.4 හයිඩ්‍රොලික් එස්කැවේටර්
   3.5 බැකෝ ලෝඩර්
   3.6 ස්කිඩ් ස්ටියර් ලෝඩර්

4. විශේෂිත උපකරණ
   4.1 මොබයිල් ක්‍රේන්
   4.2 ප්ලාන්ට් ට්‍රාන්ස්පෝටර්
   4.3 ෆෝක් ලිෆ්ට් ට්‍රක්
   4.4 ට්‍රක් මවුන්ටඩ් ක්‍රේන්

5. වෘත්තීය පරීක්ෂණ
   5.1 ජාතික වෘත්තිය පරීක්ෂණ
   5.2 NVQ පරීක්ෂණ

6. **සම්මන්ත්‍රණ /වැඩමුළු**

ඉදිකිරීම් කර්මාන්තයේ ඉල්ලුම මත උපකරණ කළමනාකරණය සහ අධීක්ෂණ වැඩසටහන් සහ කුසලතා පරීක්ෂණ CEOTC මඟින් පවත්වනු ලබයි. වැඩි ප්‍රතිලාභ සහ CEOTC හි කාර්යයන් විවිධාංගිකරණය අරමුණු කොට 2016 වසරේදී රියැදුරන් සඳහා විශේෂ වැඩමුළුවක් ද පවත්වන ලදි.

2016 වසරේදී එක් එක් පුහුණු පාඨමාලාවන්ට අදාල පුහුණුවන්නන්ගේ ඉලක්කගත ප්‍රතිඵල සහ ජයග්‍රහණයන් පහත වගුවේ දක්වා ඇත.

වගුව-6.3.1

| | පුහුණු වැඩසටහන | අපේක්ෂිත ප්‍රමාණය | | ප්‍රගතිය | |
|---|---|---|---|---|---|
| | | වැඩසටහන් ගණන | සහභාගි වන්නන් ගණන | වැඩසටහන් ගණන | සහභාගි වූ ගණන |
| **1.0** | ප්‍රාථමික පුහුණුව | | | | |
| | 1.1 මූලික ඉදිකිරීම් යන්ත්‍ර නඩත්තු ශිල්පය | 26 | 710 | 20 | 504 |
| **2.0** | කුසලතා සංවර්ධනය | | | | |
| | 2.1 සැහැල්ලු උපකරණ | 05 | 05 | -- | -- |
| | 2.2 ට්‍රැක්ටර් | 05 | 05 | 03 | 03 |
| | 2.3 සෙල්ෆ් ප්‍රොපෙල්ඩ් රෝලර් | 06 | 15 | 03 | 12 |
| | 2.4 ඩම්ප් ට්‍රක් | 05 | 05 | - | - |
| **3.0** | පස් ඉවත්කරන උපකරණ මූලික මොඩියුල | | | | |
| | 3.1 ග්‍රෝලර් ට්‍රැක්ටර් | 04 | 20 | 01 | 02 |
| | 3.2 වීල් ලෝඩර් | 06 | 30 | 01 | 02 |
| | 3.3 මෝටර් ග්‍රේඩර් | 09 | 70 | 07 | 68 |
| | 3.4 හයිඩ්‍රොලික් එස්කැවේටර් | 10 | 100 | 08 | 75 |
| | 3.5 බැකෝ ලෝඩර් | 14 | 210 | 16 | 209 |
| | 3.6 ස්කිඩ් ස්ටියර් ලෝඩර් | 05 | 10 | 01 | 05 |
| **4.0** | විශේෂිත උපකරණ | | | | |
| | 4.1 මොබයිල් ක්‍රේන් | 07 | 20 | 03 | 11 |
| | 4.2 ප්ලාන්ට් ට්‍රාන්ස්පෝමර් | 11 | 30 | 02 | 07 |
| | 4.3 ෆෝක් ලිෆ්ට් ඔපරේටර් | 11 | 30 | 06 | 15 |
| | 4.4 ට්‍රක් මවුන්ටඩ් ක්‍රේන් | 05 | 05 | 04 | 21 |
| | **එකතුව** | **129** | **1265** | **75** | **934** |

වෘත්තීය කෙරෙහි ප්‍රමාණවත් අවධානයක් යොමු නොකරන ශ්‍රී ලාංකික තරුණයින්ගේ ආකල්ප හා කැමැත්ත වර්ධනය කිරිමට සහ දරිද්‍රතාවය ජයගැනීමට එක් සාර්ථක මාර්ගයක් වශයෙන්ද ඉදිකිරීම් උපකරණ ක්‍රියාකරු පුහුණු වැඩසටහන හඳුන්වා දිය හැක.

ඉදිකිරීම් යන්ත්‍ර මෙහෙයුම් ශිල්පී මධ්‍යස්ථානය මඟින් කර්මාන්තයේ ඵලදායිතාවය වර්ධනය කිරීම සඳහා ප්‍රවර්ධන වැඩසටහන් කිහිපයක් ද පවත්වා ඇත. මේ සඳහා බාධකයක්ව පවතින්නේ මෙම පුහුණු වැඩසටහන හැදීරීම සඳහා දැරීමට වන මූල්‍ය පිරිවැයයි. නමුත් 2016 වසරේදී ''දිවිනැගුම'' වෘත්තිය පුහුණු ආයෝජන වැඩසටහන මගින් අයැදුම්කරුවන් 97 දෙනෙකුට මේ සඳහා සහයෝගය ලබා දෙන ලදි. ඉහත වැඩසටහන් මඟින් 2014 සිට 2016 දක්වා කාලය තුළ වාර්ෂිකව පුහුණු ක්‍රියාකරු නිමැවුම් ඉහළ නංවන ලදි.

- **ඉදිකිරීම් උපකරණ කුළියට දීම**

මෙම මඟින් සපයනු ලබන අමතර සේවාවකි. ඉදිකිරීම් උපකරණ කුළියට දීම එමඟින් අමතර වැඩි ආදායමක් විදුහලට ලබා දෙයි. අවශ්‍ය යන්ත්‍ර ප්‍රමාණය පුහුණු කටයුතු සඳහා වෙන් කිරීමෙන් අනතුරුව ඉතිරිව තිබේ නම් කුළී පදනම මත යන්ත්‍ර සූත්‍ර කොන්ත්‍රාත්කරුවන්ට සහ රාජ්‍ය ආයතනවලට සැපයීමේ ක්‍රියාවලියට ප්‍රමුඛත්වයක් දෙනු ලබයි. පාවිච්චියට නොගන්නා යන්ත්‍රෝපකරණ පමණක් කුළියට දෙනු ලබයි.

- **ඉදිකිරීම් උපකරණ ක්‍රියාකරු පුහුණුව -නිවාස සහ ඉදිකිරීම් අමාත්‍යාංශය**

දකුණු පළාතේ රැකියා විරහිත තෝරාගත් තරුණ තරුණියන් වෙනුවෙන් විශේෂ පුහුණු වැඩසටහනක් ඔවුන්ගේ හැකියාවන් වර්ධනය කිරීම උදෙසා පවත්වන ලදී. මෙම වැඩසටහන සඳහා නොමිලයේ නවාතැන් පහසුකම්, ආහාර සහ ප්‍රවාහන පහසුකම් සපයන ලදී. මේ යටතේ පුහුණුවන්නන් 40 දෙනෙකු තමාගේ ප්‍රමුඛත්වය මත ඉදිකිරීම් උපකරණ පුහුණුව ලබාගන්නා ලදී.

**2016 වසර තුළ ඉදිකිරීම් යන්ත්‍ර මෙහෙයුම් ශිල්පී මධ්‍යස්ථානය මඟින් උපයාගන්නා ලද ආදායම**

| රැකියා වර්ගය | ආදායම (රු.) |
|---|---|
| පුහුණු පාඨමාලාවන් | 16,241,000.00 |
| යන්ත්‍ර සූත්‍ර කුළියට දීම | 6,342,124.50 |
| වෘත්තිය පරීක්ෂණ | 3,000.00 |
| ක්‍රියාකරුගේ හැඳුනුම්පත | 273,250.00 |
| නිදනශාලා ගාස්තු | 2,582.61 |
| කුළී | 21,083.29 |
| වෙනත් | 120,780.90 |
| **එකතුව** | 23,003,821.30 |

### 6.3.2 ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ පුහුණු කිරීමේ මධ්‍යස්ථානය (CETRAC)

සිඩා (CIDA) ආයතනයේ යාන්ත්‍රික පුහුණු අංශය වන ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ පුහුණු මධ්‍යස්ථානය (CETRAC), බත්තරමුල්ල පැලවත්තේ ඩී.පී.විජේවර්ධන මාවතේ අංක 17 දරණ ස්ථානයේ පිහිටා ඇත. ඉදිකිරීම් උපකරණ නඩත්තුව අලුත්වැඩියාව සහ කළමනාකරණය පිළිබඳ පුහුණු පාඨමාලාවන් පැවැත්වීමට මෙම අංශය හොඳින් සකස් කර තිබේ. තවද ව්‍යාපෘති සහ නඩත්තු කළමණාකරුවන්, යාන්ත්‍රික ඉංජිනේරුවන්, වැඩසටහන් අධීක්ෂකයින්, ජ්‍යෙෂ්ඨ කාර්මිකයින්, යන්ත්‍ර සහායකයින් සහ පාසල් හැරගිය අය සඳහා මෙහි පුහුණු පාඨමාලා පැවැත්වේ.





### 6.3.2 (අ) CETRAC ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ පුහුණු මධ්‍යස්ථානය මඟින් පවත්වනු ලබන පුහුණු වැඩසටහන්

1996 ඔක්තෝබර් සිට 2001 සැප්තැම්බර් දක්වා පැවති තාක්ෂණ සහයෝගිතා කාලපරිච්ඡේදයේදී ජපාන විශේෂඥයින්ගේ සහයෙන් ඉදිකිරීම් උපකරණ නඩත්තුව සඳහා වූ CETRAC පුහුණු වැඩසටහන් දියුණු කරන ලදි. CETRAC මූලිකවම ඉදිකිරීම් උපකරණ නඩත්තු සහ කාර්මික ශිල්පීන්, අධීක්ෂණයන් හා ඉංජිනේරුවන් සඳහා පුහුණුව ලබාදේ. මෑතකදී සිඩා**(CIDA)** විසින් CETRAC හි ගොඩනැගිලි සේවා ඉංජිනේරු පුහුණු වැඩසටහන් ආරම්භ කර සාර්ථකව පවත්වාගෙන යනු ලබයි.

- **කර්මාන්තයට පිවිසෙන නවකයන් සඳහා පැවැත්වෙන පාඨමාලාවන්**

ඉදිකිරීම් කර්මාන්තයේ ඉහල ඉල්ලුමක් පවතින්නා වූ මිනිස් සම්පතෙහි අවශ්‍යතාවය සපුරාලමින්, තරුණයින්ගේ රැකියා වියුක්තියට පිළියමක් වශයෙන් කලින් පාසල් හැරගිය අය සඳහා වෘත්තිය පුහුණු පාඨමාලා වැඩි ප්‍රමාණයක් පැවැත්වීමට හා වැඩිදියුණු කිරීමට තීරණය කරන ලදි. ඒ අනුව, 2016 වසරේදී පහත සඳහන් පාඨමාලාවන් පවත්වන ලදි.

**I. ඉදිකිරීම් උපකරණ යාන්ත්‍රික පුහුණු පාඨමාලාව**

මූලික යාන්ත්‍රික පුහුණු පාඨමාලාව ජාතික ආධුනිකත්ව මණ්ඩලය සහ ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු අධිකාරියේ සහයෝගය ඇතිව පවත්වනු ලබයි. එය CETRAC හි මාස 9 ක ආයතනික පුහුණුවක් සහ මාස 27 ක කර්මාන්තය තුල රැකියා පුහුණුවකින් ද සමන්විත අවුරුදු 3 ක පාඨමාලාවකි. මෙම පාඨමාලාව සඳහා සුදුසුකම්ලාභීන් වන්නේ අ.පො.ස සාමාන්‍ය පෙළ සමත් පාසල් හැරගිය අය වේ. මෙම පාඨමාලාව මගින් නවීන ඉදිකිරීම් උපකරණ අලුත්වැඩියාව සහ නඩත්තුව පිළිබඳ සියළු කරුණු ආවරණය කරයි. මීට වාර්ෂිකව පුහුණුවන්නන් 60 ක් බඳවා ගනියි.

පුහුණු කාලය අතරතුර නොමිලයේ නවාතැන් පහසුකම්, පාඨමාලා අත්පොත්, ප්‍රවාහන පහසුකම්, නිල ඇඳුම්, ආරක්ෂණ උපකරණ, මෙවලම් ආදිය මෙම පුහුණුවන්නන් සඳහා ලබාදෙනු ඇත. සෑම වසරකට විවිධ කාණ්ඩවලට අයත් පුහුණුකරුවන් 100 ට ආසන්න ප්‍රමාණයක් CETRAC හි මෙම ආයතනික පුහුණුව ලබන අතර මේ සඳහා රු.මි. 10 ක් පමණ වන සියලු බර පැන රජයට දැරීමට සිදුවෙයි. මෙම වැඩසටහනෙන් පුහුණුව ලැබූවන් සියල්ලම වාගේ දේශීයව හා විදේශීයව රැකියා අවස්ථා ලබාගෙන ඇත. ඔවුන්ගෙන් ඇතැම් පිරිසක් ඉදිකිරීම් උපකරණ අලුත්වැඩියාව හා නඩත්තු කිරීම සඳහා තමන්ගේ වැඩබිම් පිහිටුවා ගෙන ඇත.

**II. සේවකයන්ගේ කුසලතා වර්ධනය සඳහා වන වැඩිදුර පුහුණු පාඨමාලා**

ඉදිකිරීම් උපකරණ අලුත්වැඩියාව, නඩත්තු කිරීම, කළමනාකරණය හා සම්බන්ධ කාර්මික ශිල්පීන්ගේ, අධීක්ෂකයන්ගේ හා කළමනාකරුවන්ගේ තාක්ෂණික දැනුම ඉහල දැමීම සඳහා වැඩිදුර පුහුණු පාඨමාලා සැලසුම් කර ඇත. සෑම පුහුණුවන්නෙකුටම අවධානය යොමු කිරීම සඳහා බඳවා ගැනීම පුහුණුවන්නන් 12 ට සීමා කොට ඇත. මෙම පාඨමාලා හැදෑරීම සඳහා අදාළ ක්ෂේත්‍රයේ ප්‍රමාණවත් පළපුරුද්දක් අවශ්‍ය වේ.

**III. කනිෂ්ඨ කාර්මික ශිල්පීන් සඳහා පුහුණු වැඩසටහන (අදියර 2)**

ඉදිකිරීම් උපකරණ අලුත්වැඩියා කරන ස්ථාන වල සේවය කරන කණිෂ්ඨ කාර්මික ශිල්පීන්ගේ දැනුම හා කුසලතාවය වැඩිදියුණු කිරීම සඳහා මෙම වැඩසටහන සැලසුම් කර ඇත. මෙම පාඨමාලාව හැදෑරීම සඳහා අවුරුදු 2 ත් 5 ත් අතර පළපුරුද්දක් අවශ්‍ය වේ. සේවායෝජකයන්ට ඔවුන්ගේ පුහුණු අවශ්‍යතා මත පදනම්ව ඔවුන්ගේ කාර්මික ශිල්පීන් ඕනෑම තෝරාගත් මොඩියුලයක් පුහුණු වීම සඳහා යෙදවීම පිණිස මෙම පුහුණු පාඨමාලාව විවිධ මොඩියුලයන්ට බෙදා ඇත. හයිඩ්‍රොලික් (ද්‍රාව ද්‍රාව බල) මෙකාට්‍රොනික්ස් (යාන්ත්‍ර විද්‍යුත් විද්‍යාව) වැනි ඇතැම් මොඩියුල සඳහා ඉහල ඉල්ලුමක් ඇති බැවින් මෙම මොඩියුල සඳහා ඇතැම් විට අමතර පාඨමාලා පැවැත්වීමට සිදුවේ.

## IV. ජ්‍යෙෂ්ඨ කාර්මික ශිල්පීන් සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම (අදියර 3)

මෙම උසස් පුහුණු වැඩසටහන ජ්‍යෙෂ්ඨ කාර්මික ශිල්පීන්ගේ දැනුම හා කුසලතා ඉහළ දැමීම හා ඔවුන්ගේ වැරදි පිළිබඳව නිශ්චිතව හඳුනාගැනීමට හා ඒවා නිවැරදි කිරීමට සුදුසු පරිදි සැලසුම් කර තිබේ. අවුරුදු 5 ට වැඩි පලපුරුද්දක් ඇති කාර්මික ශිල්පීන් මෙම පාඨමාලාව සඳහා සුදුසුකම් ලබයි. සේවායෝජකයන්ට තම කාර්මික ශිල්පීන් ඔවුන්ගේ පුහුණු අවශ්‍යතා අනුව තෝරාගත් ඕනෑම පුහුණු වැඩසටහනක් සඳහා යෙදවීමට හැකිවන පරිදි සැකසූ විවිධ මොඩියුල 6 ක් මෙම පුහුණු වැඩසටහන් සමන්විත වේ. හයිඩ්‍රොලික් සහ මෙකාට්‍රොනික්ස් (යාන්ත්‍ර විද්‍යුත් විද්‍යාව) වැනි ඇතැම් මොඩියුල සඳහා ඉහළ ඉල්ලුමක් ඇති බැවින් මෙම මොඩියුල සඳහා ඇතැම් විට අමතර පාඨමාලා පැවැත්වීමට සිදුවේ.





## V. අධීක්ෂකයින් සඳහා පුහුණු වැඩසටහන්

ඉදිකිරීම් උපකරණ නඩත්තු කිරීම පිළිබඳ වගකීම දරන වැඩබිම් අධීක්ෂකයන්ගේ දැනුම වර්ධනය කිරීම සඳහා මෙම අධීක්ෂණ පුහුණු වැඩසටහන සැලසුම් කොට තිබේ. අදාළ ක්ෂේත්‍රයේ වසර 2 ක පලපුරුද්ද ඇති අධීක්ෂකයන් මෙම පාඨමාලාව සඳහා බඳවා ගනු ලැබේ.

## VI. ඉංජිනේරුවන්/ කළමණාකරුවන් සඳහා පුහුණු වැඩ සටහන

ඉදිකිරීම් උපකරණ භාවිතා කිරීමේ හා නඩත්තු කිරීමේ යෙදී සිටින ඉදිකිරීම් උපකරණ ඉංජිනේරු වැඩබිම් කළමණාකරුවන්, ව්‍යාපෘති කළමණාකරුවන් ආදීන්ගේ දැනුම වර්ධනය සඳහා මෙම පුහුණු වැඩසටහන් සකසා ඇත. මෙම පාඨමාලා සඳහා වසර දෙකක පළපුරුද්දක් ඇති ඉංජිනේරුවන් බඳවා ගනු ලැබේ.

ඉදිකිරීම් උපකරණ භාවිතා කිරීමේ හා නඩත්තු කිරීමේ වගකීම දරන සිවිල් ඉංජිනේරුවන් හා ව්‍යාපෘති කළමණාකරුවන්ට තාක්ෂණික දැනුම ලබාදීම සඳහා "ඉදිකිරීම් උපකරණ භාවිතා කිරීම" පිළිබඳ පුහුණු පාඨමාලාව සකස් කොට ඇත. ඊට සහභාගීවන්නන්ට වසර 2 ක පළපුරුද්දක් තිබිය යුතුය.

ඉදිකිරීම් උපකරණ නඩත්තු කිරීම හා අලුත්වැඩියා කිරීමේ වගකීම දරන යාන්ත්‍රික ඉංජිනේරුවන්ට හා ඉදිරිපෙළ කළමණාකරුවන්ට තාක්ෂණික දැනුම ලබාදීම සඳහා "ඉදිකිරීම් උපකරණ නඩත්තු කිරීම" පිළිබඳ පුහුණු පාඨමාලාව සකස් කොට ඇත. ඊට සහභාගීවන්නන්ට වසර 2 ක පළපුරුද්දක් තිබිය යුතුය.





## VII. ගබඩා/සැපයීම්/ව්‍යාපෘති කාර්ය මණ්ඩලය සඳහා වන පුහුණු වැඩසටහන්

සාමාන්‍යයෙන් ඉදිකිරීම් කර්මාන්තය තුළ සේවය කරන ගබඩා/සැපයීම්/ව්‍යාපෘති කාර්ය මණ්ඩලයට ක්‍රමවත් පුහුණුවක් ලබා ගැනීමට තිබෙන අවස්ථා සීමිතය. මෙම තත්ත්වය අලුත්වැඩියා මධ්‍යස්ථානවල මනා ක්‍රියාකාරීත්වයට බාධා පමුණුවන විවිධ ප්‍රායෝගික ගැටලු ඇති කරයි. මෙම පුහුණු වැඩසටහන පුහුණු අවශ්‍යතාවය සපුරා ගැනීම සඳහා ඇති කරන ලදි.

## VIII. ගොඩනැගිලි සේවා ඉංජිනේරු වැඩසටහන්

ගොඩනැගිලි ඉංජිනේරු සේවා ක්ෂේත්‍රයේ ඉංජිනේරුවන් හා ගෘහ නිර්මාණ ශිල්පීන් සඳහා CETRAC ආයතනය මගින් බොහෝ පාඨමාලා පවත්වනු ලැබේ. වාණිජ ගොඩනැගිලි සේවා නඩත්තු කිරිම සඳහා අවශ්‍ය වන ගොඩනැගිලි සේවා ආවරණය කිරීමට වැඩ සටහන් සුළු ප්‍රමාණයක් සකස් කොට තිබේ.
ඒවා ගිනි ආරක්ෂක පද්ධතිය , විදුලි පද්ධතිය, වායු සමීකරණ හා සුළං කවුලු පද්ධති, ජල සම්පාදන හා අපවහන පද්ධති ආවරණය කරයි. පසුගිය වසර තුලදී මෙවැනි වැඩසටහන් ගණනාවක් සාර්ථකව නිමකරන ලදි.

- **සේවාදායකයන්ගේ සේවා අවශ්‍යතා මත සකස් වූ පුහුණු වැඩසටහන්**

CETRAC ආයතනය දීර්ඝ කාලීනව ලබා ඇති පළපුරුද්ද සමගින් රටේ වෙනස්වන ඉල්ලුමට සරිලන පරිදි සේවාදායක අවශ්‍යතා මත ගොඩනැගුණු පුහුණු වැඩසටහන් වැඩි දියුණු කිරිම තුළින් විවිධ හා විශේෂිත පුහුණු ඉල්ලීම සාර්ථකව සපුරාදීමට යටත්ව ඇත.
2016 වසරේදී CETRAC කාර්ය සාධනය පහත පරිදි දැක්වේ .

| අනු අංකය | පුහුණු පාඨමාලා | ලියාපදිංචි ගත | | අවසන් කළ | |
|---|---|---|---|---|---|
| | | පාඨමාලා ගණන | සහභාගි වන්නන් ගණන | පාඨමාලා ගණන | සහභාගි වූ ගණන |
| **01** | **(පළමු අදියර) පාසල් හැර ගිය අය සඳහා ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ කාර්මික ශිල්පී පාඨමාලාව (BM) තුන් අවුරුදු පාඨමාලාව** | 6 | 180 | 2 | 51 |
| | **පුහුණු පාඨමාලා** | **ඉලක්කගත නිමැවුම්** | | **සැබෑ නිමැවුම්** | |
| | | පාඨමාලා ගණන | සහභාගි වන්නන් ගණන | පාඨමාලා ගණන | සහභාගි වූ ගණන |
| **02** | **ආධුනික ශිල්පීන් (අදියර II)** | | | | |
| | ඩීසල් එන්ජින් නඩත්තුව | 1 | 15 | 1 | 22 |
| | හයිඩ්‍රොලික් පද්ධතිය නඩත්තුව16M22 | 1 | 16 | 1 | 40 |
| | ඩීසල් ජෙනරේටර් නඩත්තුව – 16M25 | 1 | 20 | 1 | 41 |
| | සුක්කානම, තිරිංග හා ක්ලච් පද්ධති නඩත්තුව - 16M26 | 1 | 15 | - | - |
